# පාසල යන කාලයේදී මම ආදරවන්තියක් නොවෙයි

# උරේෂා



## ළමාවිය

උරේෂා කියන්නේ පුංචි කාලයේ බොහොම ලැජ්ජාශීලී දැරිවියක්. කිසිම කෙනෙක් එක්ක වැඩිය කතාබහ කළ කෙනෙකු නොවෙයි. එහෙම වුණත් නිවෙසේදී ඇ පුංචි බට්ටිච්චියක වගේ ගීත ගැයුවා. නැටුවා. දවසක් මේ පුංචි බට්චිච් කදිම වැඩක් කළා. ඒ ඇ සතු ලැජ්ජාවට ඒක කදිම නිදසුනක්. මේ වෙනකොට උරේෂාට වයස අවුරුදු පහක් විතර ඇති. උරේෂාගේ තාත්තා ධර්ම ශ්‍රී වික්‍රමසිංහත්, අම්මා චන්ද්‍රා වික්‍රමසිංහවත් ඇව එක්ක ගෙන ගියේ හඬමාමා වැඩසටහනට. ඒ ගීයක් ගයන්නට. ඒත් එදා තුන්දෙනාටම ආපස්සට එන්න වුණා. පුංචි උරේෂා ගීතය නොගැයුව නිසා.

එහෙම වුණත් උරේෂාගේ අම්මත්, තාත්තාත් ඉන් පසුබට වුණේ නැහැ.ඔවුන් තමන්ගේ නිවෙසේ එක්කොට-සක පවත්වන සුජාතා අත්තනායකගේ සංගීත පන්තියට පුංචි උරේෂාව ඇතුළත් කළා. මෙහෙම ඉන්න අතරයි උරේෂා දූට කදිම අවස්ථාවකට මග පෑදෙන්නේ. ඒ 'ශක්තිය ඔබයි අම්මේ' චිත්‍රපටයේ පසුබිම් ගායනයකට. මේ චිත්‍රපටයේ කුඩා පිරිමි ළමයකුගේ මුවෙන් ගැයෙන ගීපද වැල් හතරක් ගයන්න සුජාතා ගුරුතුමිය, උරේෂාව එක්ක ගෙන යන්නේ ස්ටුඩියෝ එකකට. එතැන් පටන් දිගටම වගේ උරේෂාදූට චිත්‍රපටවල ගී ගයන්න ආරාධනාලැබෙන්නේ එක දිගට. "එතැන ඉඳලා මට 'ඉන්ස්පෙක්ටර් ගීතා' 'සලඹක් හඬයි','පුතුනි මට වාසනා' ඇතුළු චිත්‍රපට රාශියකම පසුබිම් ගී ගයන්න ආරාධනා ලැබෙනවා. තාත්තාගේ 'මල්සර දෝණී' චිත්‍රපටයට ගයන 'උන්නා එක ගංගාවක' ගීතයෙන් මාව මුළු රටම හඳුනා ගන්නේ ඒ අතරයි."

## පාසල් විය

"නර්තනයට මම දක්ෂ වුණත් මට වැඩිපුර අවස්ථා ලැබෙන්නේ ගායනයටයි. ඒ නිසා මම වැඩිපුරම නැඹුරු වෙන්නේ ගායනය අංශයටයි. 11 වසරේදී මම සංගීතයට මාරු වෙන්නෙත් බොහෝ දෙනාගේ විමසීම නිසාවෙන්. ඔවුන් මගෙන් නිතරම විමසුවේ 'ගායනයට දක්ෂ ඔයා ඇයි සංගීතය තෝරා ගත්තේ නැත්තේ' කියලයි. ඒ නිසාම මම ඕ ලෙවල් පන්තියේදී සංගීතය තෝරා ගන්නවා. මගේ මේ සෑම කටයුත්තක් පිටුපසම අම්මාත්, තාත්තාත් සෙවණැල්ල වගේ ඉන්න නිසා ඒක මට ලොකු ආශිර්වාදයක් වෙන්නේ ඉබේමයි. ඕ ලෙවලවලින් පස්සේ ඒ ලෙවල්වලදී මම සංගීතය ඉගෙන ගන්නේ ඔස්ටින් මුණසිංහයන් යටතේයි. අන්තිමට මම සංගීතය හදාරන්නේ ලයනල් අල්ගම මහත්තයාගෙන්. මේ අතරත් මට විවිධ සංගීත ප්‍රසංගවලට යන්න ආරාධනා ලැබෙනවා. මගේ පාසල් කටයුතුවලට බාධාවක් නොවෙන්න ඒ දේවල්වලට සහභාගි වෙන්නත් මාව උනන්දු කරන්නේ අම්මයි, තාත්තයි."

## යොවුන් විය

"පාසල් යන කාලයේදී මම ආදරවන්තියක් නොවෙයි. මගේ පාසලේ ඉන්න යෙහෙළියන්ට ආදරවන්තයන් සිටියත් මට ඒ වගේ කෙනෙක් සිටියේ නැහැ. පන්තියේ සිටිය දඟකාරම ශිෂ්‍යයාව මම වුණත් කෙළිදෙලෙන් තමයි කාලය ගත කළේ. අනික එක මම හැදුණේ වැඩුණේ මව්පියන්ගේ දැඩි ආරක්ෂාව මැද්දේ. මගේ යෙහෙළින් නිදහසේ එහෙ මෙහෙ ගියත් මට එහෙම යන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. කොහේ ගියත් මම ගියේ මගේ මව්පියන් එක්කමයි.

## කෝකිලාවක්

"පුංචි කාලයේ ඉඳලාම වෘත්තිය ගායිකාවක් විය යුතුය කියන අදහසේ මා කිසිම දවසක සිටියේ නැහැ. මුල් කාලයේ මම ප්‍රසංගවලට පවා යන්න අදිමදි කරනවා. ඒ මගේ පාසල් වැඩ අතපසු වේවි කියලයි. ඊට කාලයකට පස්සේ චිත්‍රපට පසුබිම් ගායනයට, ප්‍රසංගවලට, කැසට්පටවලට ලැබෙන ආරාධනාත් එක්ක මා තෝරාගත යුතු මාධ්‍ය කුමක්දැයි කියන එක මට හැගෙනවා. ගායනයට මගේ හැකියාව තිබුණත් මම හිටියේ වෙනත් රැකියාවක් වෘත්තිය විදියට තෝරා ගන්නයි. ඒ ලෙවල් කලාටත් පස්සෙයි මා තීරණය කරන්නේ මට සුදුසුම මාධ්‍ය මොකක්ද කියලා. ඒ අනුව මා ගායනය මගේ වෘත්තිය විදියට තෝරා ගන්නවා."

## විවාහය

"මගේ ගමනට තාත්තාගේ යෝධ සෙවණැල්ල බලපෑවේ පුදුම විදියට. මම ගායිකාවක් වීමේ ගෞරවය හිමිවිය යුත්තේ මගේ දෙමවුපියන්ටයි. ඒ වගේම ඒ දෙන්නාගෙන් ලැබුණු ආරක්ෂාව, ධෛර්ය මගේ ජීවිතයට ආලෝකය ගෙනාවා. මාව විවාහ කර ගන්න කෙනත් ඔවුන් වගේම විය යුතු බවයි මා නිතරම සිතුවේ. ඔහු මගේ කලා කටයුතු දිගටම කරගෙන යනවට කැමැති විය යුතුයි. ඔහු මට වඩා වෙනස් රැකියාවක නිරත විය යුතු බවත් මා සිතුවා. එහෙම කෙනෙක් ලැබුණේ නැතිනම් විවාහ නොවනවා කියන මතයෙත් මා කාලයක් සිටියා. කලා ක්ෂේත්‍රයේම කෙනෙක් විවාහ කර ගන්නත් මගේ කිසිම අදහසක් තිබුණේ නැහැ. මට එතෙක් ගෙනාව යෝජනාවලින් සමහරෙක් ආවේ මගේ ජනප්‍රියත්වයටයි. ඒ අයට මම කැමැති වුණේ නැහැ. මේ හේතු නිසා මම පරක්කු වෙලයි විවාහ වුණේ. ඒත් මම සිතුව කෙනාම මට ලැබුණා."

## කැදැල්ල

"ගායන දිවිය වගේම මගේ පෞද්ගලික ජීවිතයත් සාර්ථක කර ගත්තොත් පමණයි මට සාර්ථක ගැහැනියක් විය හැක්කේ. ඒ සඳහා මම කාලය වෙන්කර ගත්තා. නිවසේ කටයුතු සිදු කළෙත් මගේ අත් දෙකෙන්මයි. නිවෙස අස්පස් කරන කටයුතු පටන් කෑම හදන කටයුතු දක්වාත් කළේ මමමයි. මගේ සැමියා මා උයන දේවල් කන්නයි වඩාත් කැමැත්තක් දක්වන්නේ. ඒ නිසා ඒ ගැන විශේෂයෙන්ම මගේ අවධානය යොමු වෙනවා. ඒ වගේම නිතරම මේ හැම වැඩකම පිළිවෙළක් මට අවශ්‍යයයි. ඒ හැමදෙයක් අතරම මම, මගේ සංගීත කටයුතුත් කරගෙන යනවා. සංගීත කටයුතු කරන්න තිබෙන දවසේදී මම උදෙන්ම නැඟිටිනවා. නිවෙසේ සියලුම කටයුතුත්, සැමියාට අවශ්‍ය සියලුමදේත් ලබාදී, පුතාගේ කටයුතුත් කරලයි මම මගේ කටයුතුවලට යන්නේ. ඊට මට සහයෝගය ලැබෙන්නේ මගේ දෙමවුපියන්ගේ. මගේ සිතේ තිබෙන එකම සතුට වන්නේ පුතාට හොඳ අම්මා කෙනෙකු වීමත්, සැමියාට හොඳ බිරියක් වීමත්. මේ සියලුම කටයුතුවලට මට උදව් කරන්නේ මගේ සැමියා. මාව ප්‍රසංගවලට එක්ක ගෙන යන තැන ඉඳගෙන, බොහොම ආදරෙන් බලා ගන්න තැන පටන් සියලුම දේ ඔහු කරන්නේ කැමැත්තෙන්."



මාෂා විස්වාශිනී